# <u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු</u>

අංක 2055/13 දරණ 2018.01.24 දිනැති ( අතිවිශේෂ ) ගැසට් පත්‍රයේ පළ කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් සම්බන්ධ විධිවිධාන වලට ද ස්ථාන මාරු ප්‍රතිපත්තිය වද ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු අදාළ වර්ෂයේ ජනවාරි මස 01 දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක විය යුතුය.

03. ස්ථාන මාරු මණ්ඩල පත් කිරීම.

3.1 ස්ථාන මාරු කමිටුවේ කාර්ය භාරය

- බස්නාහිර පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ස්ථාන මාරු යෝජනා ඉදිරිපත් කිරීම.

3.2 දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ බලය පවරනු ලබන නිලධාරියෙකු
- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීවරයෙකු
- සාමාජිකයන් ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ විධිවිධානයන්ට අයත් වන්නා වූ සෑම වෘත්තිය සමිතියකටම අදාළ මව් සංගමයේ නියෝජිතයෙකු හෝ පළාත් නියෝජිතයෙකු

04.ස්ථාන මාරු සඳහා පොදු ප්‍රතිපත්ති

ස්ථානමාරු සඳහා නිලධාරීන්ගේ සුදුසුකම් ආදිය පිළිබඳ තීරණ ගැනීමේදී පහත ප්‍රතිපත්ති පොදුවේ උපයෝගී කර ගත යුතුය.

4.1 අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට

(අ) බස්නාහිර පළාත් සභාවේ ආයතනයක/දෙපාර්තමේන්තුවක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සියළුම නිලධාරීන් ස්ථාන මාරු වීම් වලට යටත්වේ. ඒ අනුව අවුරුදු 05ට වැඩි සේවා කාලයක් සහිත සියලුම නිලධාරීන් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වන අතර ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකළ ද එම නිලධාරීන් සඳහා ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරු ලබා දෙනු ලැබේ. එම අයට සිදුවන අපහසුතාවයට ස්ථාන මාරු මණ්ඩලය වගකියනු නොලැබේ.

(ආ) දැඩි පෞද්ගලික අවශ්‍යතා ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරිහු ස්ථාන මාරු වීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබති.

4.2 4.1 (ආ) ඡේදයේ යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීම සඳහා 4.1 (අ) ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම සේවා ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියෙකු ඉන් පිටතට ස්ථාන මාරු කළ හැකිය.

CamScanner

4.3 සේවා කාලය ගණනය කිරීමේදී ආයතනයක්/දෙපාර්තමේන්තුවක් තුල අඛණ්ඩව හෝ ඛණ්ඩව (වැටුප් රහිත නිවාඩු/ විදේශගත වීම් වැනි හේතු මත)ගත කළ සේවා කාල වල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

4.3.1 යම් කිසි නිලධාරියෙකු එක් සේවා ස්ථානයකින් වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කරන විට එම නිලධාරියා කලින් සේවය කළ ස්ථානයන්හි විවිධ ගණ වලට අයත් ආයතනයන්හි සේවය කර ඇති කාල පරිච්ඡේද සැලකිල්ලට ගත යුතුය.මෙසේ කිරීම අවශ්‍ය වන්නේ යම් කිසි කාර්යාලයක සේවය කළ යුතු කාල පරිච්ඡේදය අවසන් වන විට වෙනත් දෙපාර්තමේන්තුවක එම කාර්ය ස්ථානයෙහිම පිහිටි උප කාර්යාලයකට මාරුවීමක් ලබා ගැනීමෙන් එකම කාර්ය ස්ථානයෙහි දීර්ඝ කාලයක් නොකඩවා සේවය කිරීම සඳහා යොදා ගත හැකි උපක්‍රම වළක්වනු පිණිසය.

4.3.2 ආයතනයක  වසර 05 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වෙනත් ආයතනයකට ස්ථාන මාරු කිරීමට හැකි සෑම අවස්ථාවකම උත්සාහ කළ යුතුය.ඒ එකම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් සේවයේ නිරත වීම වළක්වනු පිණිසය.

4.4  වසර 05ක සේවා කාලයක් අම්පූර්ණ කළ සියලුම නිලධාරීන් ස්ථානමාරුවීම්වලට යටත් වන අතර අවුරුදු 55 ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ වෙනත් ස්ථානයකට මාරු කළ හැකි වුව ද නිලධාරියාගේ ඉල්ලීමක් හෝ වෙනත් විශේෂ කරුණු මත මිස දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු නොකළ යුතුය. තව ද වයස 58 ඉක්මවූ නිලධරයන්ට ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කය තුළ ද ස්ථාන මාරු නොකළ යුතුය.

4.5 ස්ථාන මාරු කිරීමේදී හා අභියාචනා  ඉදිරිපත් කිරීමේදී, ඒ සඳහා සකස් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

4.6 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීනව අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් වැනි නිලධාරියාට මුහුණ දීමට සිදුවන, විසඳාගත නොහැකි ගැටළු වලදී පිළිගත හැකි කරුණු සහිතව තම ආයතන ප්‍රධානීගේ නිර්දේශයන්ද සමග ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.

4.7 (අ) . වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා සිටින නිලධාරියෙකුට නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි  වත්මන් සේවා ස්ථානයෙන් කල් වේලා ඇතිව නිදහස් කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වන බැවින් එසේ කටයුතු කළ යුතු වන්නේය. එසේම නියමිත පරිදි නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීම ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන්ගේ වගකීම වන්නේය.

(ආ) මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධාරියා වෙත වාර්තා කරනු ලැබේ.

4.8 අදාළ සේවයේ පිළිගත් වෘත්තීය සමිතියක මව් සංගමයේ සභාපති/ලේකම්/භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක මණ්ඩලයේ සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සමිතියේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගත යුතු වේ.මෙම ස්ථාන මාරු කිරීමේ කාර්යය පරිපාටියේදී වෘත්තිය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ එක් සේවාවක් පමණක් නියෝජනය කරනු ලබන වෘත්තිය සමිති නිලධාරීන් පිළිබඳ විස්තර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති ප්‍රකාරව අදාළ මාරුවීම් බලධරයා වෙත මාරු කමිටු ක්‍රියාත්මක වීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

4.9 යම් නිලධරයෙකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම මත පමණි.එසේම එවැනි නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතුවේ.මෙවැනි නිලධරයන් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නතම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමට අනුව අදාළ කාර්යාලයකට වේ.

4.10 දරුවන් පාසල් යැවීමේ කටයුතු වලට අවහිරයක් නොවනු පිණිස හැකිතාක් දුරට සෑම ස්ථාන මාරු කිරීමක්ම ක්‍රියාත්මක විය යුත්තේ අදාළ වර්ෂයේ ජනවාරි 01 වන දින සිටය.

4.11 භාර්යාව හා ස්වාමිපුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනා ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලය උත්සාහ කළ යුතුය.

4.12 ස්ථාන මාරු ඉල්ලීම් සඳහා එවනු ලබන ඉල්ලුම්පත් මේ සමග අමුණා ඇති නියමිත ආකෘතියට(ඇමුණුම 1) අනුව විය යුතු අතර ඒවා ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

4.13 මෙහිදී අදාළ නිලධාරීන්ට තමන් තමන් කැමති සේවා ස්ථාන 05 ක් මනාපය අනුපිළිවෙලින් නම් කිරීමට අවස්ථාව ලබා දෙන අතර ඉන් එක් ස්ථානයකට ස්ථාන මාරුව ලබා දීමට උත්සාහ දරනු ලැබේ.

4.14 බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර අංක GOS/ADM/06/governor/2022 දරණ 2022.10.12 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

4.14.1 සියළු ස්ථාන මාරුවීම් හැකිතාක් දුරට නිලධාරීන් පදිංචි දිස්ත්‍රික්කය තුළම ලබා දිය යුතුය.

එහිදී,

- නවක නිලධාරීන් ස්ථානගත කිරීම - පළමු පත්වීම ලබන නිලධාරීන් කිසි විටෙකත් එම නිලධාරීන් පදිංචි කොට්ඨාශවලට අනුයුක්ත නොකල යුතු අතර සෑම විටම පදිංචි ස්ථානය අයත් කොට්ඨාශවලින් බැහැරව පත්වීම් ලබා දිය යුතුය.
- වසර 05 කට වරක් අනිවාර්යය ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු අතර ක්‍රමිකව තම පදිංචි ස්ථානයට ආසන්නතම ආයතනයකට ස්ථාන මාරුව ලබා දිය යුතු වේ.
- ස්වකීය සේවා කාලයේ අවසන් වසර 05 එනම්, විශ්‍රාම යාමට ආසන්න කාලය තම ස්ථිර පදිංචියට ඉතාම ආසන්නතම සේවා ස්ථානයකට ස්ථාන මාරු ලබා දීම සිදු කළ යුතුවේ.

4.15 ආයතන ප්‍රධානීන් විසින් තම ආයතන වල සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් සේවා අවශ්‍යතාවයක් මත විශේෂ නිර්දේශ ඉදිරිපත් කරන්නේ නම් නිලධාරීන් අයදුම් පත් ඉදිරිපත් කරන අවස්ථාවේදීම හෝ වසර 05 කට වැඩි ලේඛන යොමු කරන අවස්ථාවේදීම අදාළ නිර්දේශ යොමු කිරීමට සැලකිලිමත් විය යුතු අතර මාරු මණ්ඩල තීරණ දැනුම්දීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සලකා බලනු නොලැබේ. (එක් ආයතන ප්‍රධානියෙකුට සීමිත නිලධරයන් පිරිසක් සඳහා පමණක් ඉල්ලීම කළ හැක.එක් වතාවකදී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධාරියෙකු සඳහා නැවත අවස්ථාවක් දෙනු නොලැබේ. තව ද, වෛද්‍ය සහතික මගින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙලෙන ස්ථාන මාරු නොකළ යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා පුද්ගලිකවම සනාථ කළ යුතුය)

4.16 තම ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලද වහාම ඔහු/ඇය භාරයේ ඇති රාජකාරි ලිපි ලේඛන රජය සතු අනෙකුත් දේපල,යතුරු පරිඝණක මුර පද, රාජකාරි නිල හැඳුනුම්පත භාර ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුත්තේය.එමෙන්ම තමන් භාරයේ ඇති ඉහත සියළුම දේ යථා පරිදි භාර දීම සඳහා අවශ්‍ය විධිවිධාන තම ප්‍රධානීන් සමග සාකච්ඡා කර කටයුතු සලසා ගැනීම ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන්ගේ ද වගකීම වන්නේය.

## 05.වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

### 5.1 ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ කාර්ය භාරය

නිලධාරීන්ගේ ස්ථානමාරු සලකා බලා අවශ්‍ය සංශෝධන සහිතව ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමට නිර්දේශ ලබාදීම.

CS CamScanner

5.2 ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය

- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ බලය පවරනු ලබන නිලධාරියෙකු
- එම තනතුරට අදාළ ස්ථාන මාරු මණ්ඩලයේ සාමාජිකයෙකු
- සෞඛ්‍ය ලේකම් (බ.ප.) විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු
- සාමාජිකයන්ගෙන් = අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ විධිවිධානයන්ට අයත් වන්නා වූ සෑම වෘත්තීය සමිතියකටම අදාළ මව් සංගමයේ නියෝජිතයෙකු හෝ පළාත් නියෝජිතයෙකු නිරීක්ෂණ මට්ටමින් සහභාගි වීම.

5.3 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් සලකා බැලීම සඳහා බස්නාහිර පළාත් කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 195 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කරනු ඇත.සියළුම කරුණු දැක්වීම් 13 පරිශිෂ්ඨය ප්‍රකාරව ආයතන ප්‍රධානීන් /ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන් මගින් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කරුණු දැක්වීම් සලකා බලනු ලබන්නේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ ඉහත විධිවිධානයන්ට අනුකූල නම් පමණි.

5.4 නිලධාරියෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව කරුණු දැක්වීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියාට හෝ හිමිකමක් නොමැත.

5.5.ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර බලා තීරණ ගනු ඇත.

- ➢ මාරු වීම් ප්‍රතිපත්තියට අනුකූළ නොවන පරිදි සිදු කරන ලද මාරු වීම
- ➢ නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු නොවූ අවස්ථා
- ➢ නිලධාරීන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස සිදු කළ මාරුවීම ස්ථානමාරු අයදුම් කළ දිනයෙන් පසු නිලධාරීන්ට සිදුවන හදිසි විපත්,කරදර,අසනීප,වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳ පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇති නම් එම කරුණු

5.6 වෛද්‍ය හේතූන් මත ස්ථාන මාරු අවලංගු කරවා ගැනීමට හො ස්ථාන මාරු කරනු ලැබූ සේවා ස්ථානය මාරු කර ගැනීමට කරුණු දැක්වීම් ඉදිරිපත් කරන්නේ නම්, තම රෝගී තත්ත්වය රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වරයෙකුගේ වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කළ යුතුය.එසේම ස්ථාන මාරු ඉල්ලුම් කරන අවස්ථාවේ අසනීප තත්ත්වයක් පැවතියේ නම් ඒ බවට වෛද්‍ය සහතිකයේ පිටපතක්ද සමග අයදුම් පත්‍රයේ සටහන් කර තිබිය යුතුය.

5.7 ස්ථාන මාරු ඉල්ලුම් නොකරන ලද මුත් සේවා කාලය පදනම් කර ගෙන සිදු කරන ලද ලබන ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කරුණු දැක්වීම් සලකා බලනු ලබන්නේ ස්ථාන මාරු වීම් ඉල්ලුම් කරන ලද නිලධාරීන්ගේ කරුණු දැක්වීම් කෙරෙහි දැඩි සැලකිල්ලක් දැක්වීමෙන් අනතුරුවය.

5.8 වත්මන් සේවා ස්ථානයට ආසන්න ස්ථාන වල හෝ සැලකිය යුතු තරම් දුරක නොවන ස්ථාන මාරුවලට මාරුවීම් ලැබූ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු දැක්වීම් කුමන පදනමක් මත හෝ සලකා බලනු නොලැබේ.

5.9 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා බස්නාහිර පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 216 ( ආ) වගන්තිය අනුව 22 පරිශිෂ්ඨය ප්‍රකාරව පමණක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

CamScanner

5.10 තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළව ලියවිලි සහ වෛද්‍ය සහතික පිටපත් එම අභියාචනාව සමග ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතුය.සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් නොකළ කිසිදු අභියාචනාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභියාචනා කමිටුව විසින් සලකා නොලබනු ඇත.

06 . මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙදී කාල සටහන

| | |
|---|---|
| අගෝස්තු මස 15 ට පෙර | ස්ථාන මාරු කමිටුව පිහිටුවීම |
| ඔක්තෝබර් මස 01 ට පෙර | ස්ථානමාරු නියමිත ලැයිස්තුව ගෙන්වා ගැනීම හා අයදුම්පත් කැඳවීම |
| ඔක්තෝබර් මස 20 ට පෙර | ස්ථාන මාරු මණ්ඩල පැවැත්වීම |
| ඔක්තෝබර් 30 ට පෙර | ස්ථානමාරු යෝජනා පල කිරීම හා සමාලෝචන කමිටුව පිහිටුවීම |
| නොවැම්බර් 10 ට පෙර | කරුණු දැක්වීම හා අභියාචනා භාර ගැනීම |
| නොවැම්බර් මස 20 ට පෙර | අභියාචනා පිළිබඳ සමාලෝචන කමිටුව මගින් කරුණු දැක්වීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම |
| දෙසැම්බර් මස 01 ට පෙර | සමාලෝචන කමිටු තීරණ දැනුම් දී අවසන් කිරීම |
| ඊළග වර්ෂයේ ජනවාරි මස 01 වන දා සිට | නියෝග ක්‍රියාත්මක කිරීම |

07. වාර්ෂික ස්ථාන මාරු පසු විපරම් කමිටු

වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව ඊළග වර්ෂයේ පෙබරවාරි 15 දිනෙන් පසුව පසු විපරම් කමිටුවක් පවත්වා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.

08. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ වගකීම.

8.1 තම ආයතනය තුළ වසර 05කට වඩා වැඩි සේවා කාලයක් සහිත සියලුම නිලධාරීන් පිළිබඳව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳ අදාළ ආයතන ප්‍රධානීන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කල හා හරි වැරදි බලන නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර එවුන් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට ද යටත් වේ.

8.2 මාරු කමිටු මගින් ආයතනයෙන් පිටතට ස්ථාන මාරු ලබා දී ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින සිට නව සේවා රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය.

8.3 ස්ථාන මාරු ලැබූ නිලධාරීන් නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි කටයුතුවලට වාර්තා කළ පසු අදාළ අනුප්‍රාප්තික නිලධාරීන් මුදා හැරීමට අදාළ ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

8.4 නියමිත පරිදි නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීම ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන්ගේ වගකීම වන්නේය.

CamScanner

8.5 මෙම ප්‍රතිපත්තීන් සම්බන්ධයෙන් ඔබගේ සියලු ආයතනික ප්‍රධානීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් ~~දැනුවත් කළ යුතුය.~~
[illegible]

8.6 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් කාර්ය පරිපාටික රීතීන්හි 200,201,202 හා 203 වගන්ති වල සඳහන් විධි විධාන බල පැවැත්වෙනු ඇත.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 2023 - 09 - 19

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (බ.ප.)

වෛද්‍ය ධම්මිකා ජයලත්
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
බස්නාහිර පළාත

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුමත කරමි.

දිනය 2023.09.25

සෞඛ්‍ය ලේකම් (බ.ප.)

එච්. ජී. පී. ජේ. ධර්මසේන
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂණ සේවා, කාන්තා කටයුතු
[illegible] කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත